www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ග්‍රීසිය යුරෝපා සංගමයේ අනසක යටතට

**Greece under European Union diktat**

2010 පෙබරවාරි 11

පොදු ව්‍යවහාර මුදලක් හඳුන්වා දීමෙන් මෙපිට පලමු වතාවට යුරෝපා සංගමය රටක් සිය අනසකට යටත් කර ඇත. රටේ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක මට්ටමේ පවතින අයවැය හිඟය දෙවසරක් ඇතුලත දී සියයට 3 දක්වා අඩු කිරීමේ බලාපොරොත්තුවෙන් යුතුව ග්‍රීක ආන්ඩුව ක්‍රියාත්මක කරන්නට යන කුරිරු පටි තද කර ගැනීමේ පිලිවෙත බැරෑරුම් අධීක්ෂනයකට ලක් කිරීමට යුරෝපා කොමිසම අදහස් කරයි.

යුරෝපා සංගම් නිලධරය සිය අප්‍රකාශිත ආඥාදායක ක්‍රියාකාරිත්වය සඳහා පදනම් කර ගෙන ඇත්තේ ග්‍රීක ආන්ඩුව ජනවාරි මාසයේ දී යුරෝපා කොමිසම වෙත ඉදිරිපත් කල සැලැස්මකි. රජයේ මුලු වියදම සියයට 10කින් අඩු කිරීමට, රජයේ සේවකයන්ගේ වැටුප් සහ රැකියා කප්පාදු කිරීමට, විශ්‍රාම ගැනීමේ වයස වසර දෙකකින් වැඩි කිරීමට, සෞඛ්‍ය සේවාවෙහි කප්පාදු ක්‍රියාවට නැංවීමට සහ ඉන්ධන සඳහා අධිබද්දක් ඇතුලු ඉහල බදු පැනවීමට සැලැස්මෙන් අපේක්ෂිත ය.

සැලැස්ම පරීක්ෂා කරමින් සති තුනක් වැය කල යුරෝපා සංගමය තෙමසකට වරක් එය ක්‍රියාත්මක වන ආකාරය සමාලෝචනය කිරීමට අදහස් කරයි. ග්‍රීක ආන්ඩුව මොන යම් ආකාරයකින් හෝ සැලැස්මෙන් පිට පැන්න හොත් වඩා පුලුල් පටි තද කර ගැනීමේ පිලිවෙත් පනවන බවට බ්‍රසල්ස් නිලධරය තර්ජනය කරයි.

"අපට තියෙන හැම මාර්ගයක් ම යොදා ගෙන අපි ග්‍රීසියට සහාය දෙනවා, ග්‍රීසිය අධීක්ෂනය කරනවා," යුරෝපා සංගමයේ ආර්ථික සහ මුදල් කටයුතු කොමසාරිස් ජෝකින් අල්මුනියා පසු ගිය සතියේ පැවසී ය. සෞඛ්‍ය සේවාවට සහ විශ්‍රාම වැටුප් හිමිකම්වලට අදාල "ප්‍රතිසංස්කරන" සහ රැකියා වෙලඳ පොල "වහා ම" ක්‍රියාත්මක කල යුතු බව ද ඔහු කී ය. සිදු වන ඕනෑ ම පිට පැනීමකින් "වියදම් කැපීමේ හදිසි අතිරේක අවශ්‍යතා" මතු විය හැකි ය.

සැබවින් ම මින් අදහස් වන්නේ, ග්‍රීක පාර්ලිමේන්තුව තුල සිටින තේරී පත් වූ සාමාජිකයන්ට ද ග්‍රීක ආන්ඩුවට ද දසලක්ෂ සංඛ්‍යාත පුරවැසියන්ගේ ජීවිත කෙරෙහි බලපාන වියදම් ගැන තව දුරටත් නිදහසේ තීන්දු ගත නොහැකි බව යි. ග්‍රීක අයවැය පිලිබඳ පරම බලධාරිත්වය පවතින්නේ බ්‍රසල්ස්හි සිටින කිසිදු ප්‍රජාතාන්ත්‍රික සුජාත භාවයක් නැති තේරී පත් නොවුනු නිලධරයන් අත ය.

සුඩොයිෂ් සෙයිතුං පුවත්පත මෙසේ සිය අදහස් පල කලේ යඃ "... යුරෝපානුවන්ගේ බැල්ම නොවැටී ග්‍රීක පාර්ලිමේන්තුවට තව දුරටත් වියදම් පිලිබඳ තීන්දු ගත නොහැකි ය. රජයේ සේවයේ වැටුප් කප්පාදු කිරීම, විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීම සඳහා ඉතිරි කිරීම, බදු සහ සමාජ ආරක්ෂන පද්ධති ප්‍රතිසංස්කරනය කිරීම සහ සමස්ත රජයේ වියදම සියයට 10කින් කපා හැරීම සඳහා ආන්ඩුව කරන යෝජනාවලට නියෝජිතයන් සිය හිස සලා අනුමැතිය පල කල යුතු ය. ඔවුන් කර මත බ්‍රසල්ස් නුවරින් ආ පරිපාලකයෝ වාඩි ගෙන සිටිති." මොවුහු "සෑම සංඛ්‍යාවක් ම, සෑම වැය ශීර්ෂයක් ම" පිරික්සා බලති.

මෙම වර්ධනය තුල ග්‍රීසියෙන් ඔබ්බට විහිද යන අර්ථභාරයක් පවතී. එනම්, මෙම මධ්‍යධරනී රට මුලුමහත් යුරෝපා සංගමය ම සඳහා වන ආදර්ශයක් ලෙස සේවය කරන්නට යයි. එයින් නියෝජනය වන්නේ අතිමහත් ගැටලුවක සුලු කොටසක් පමනකි.

ස්පාඤ්ඤය, පෘතුගාලය, ඉතාලිය, අයර්ලන්තය සහ බෙල්ජියම යන මේ රටවල් සියල්ලෙහි ද ඒ හා සමාන ඉහල මට්ටමේ නය බරක් පවතී, බැංකු ව්‍යාපාරයේ පවතින අර්බුදය නිසා ඕස්ට්‍රියාව අගාධයට ඇදී යාමේ අනතුරට මුහුන පා සිටී. "ශක්තිමත්" යැයි කියනු ලබන ජර්මනිය සහ ප්‍රන්සය වැනි යුරෝ කලාපීය රටවල් අයවැය හිඟයන් පොදි බැඳ ගෙන ඇත.

මෙම නයගැතිකම් හට ගෙන ඇත්තේ, සමපේක්ෂන ක්‍රියාවලියේ දී බැංකු අත්විඳි පාඩු පියවා, නව ලාභ උපයා ගැනීමට ඒවාට හැකියාව ගෙන දෙනු පිනිස යුරෝපා ආන්ඩු බිලියන සිය ගනනින් බැංකුවලට පොම්ප කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. දැන්, බැංකු වෙනුවෙන් ප්‍රධාන නය එකතු කරන්නාගේ කාර්ය භාරය තමන් වෙත පවරා ගනිමින් යුරෝපා කොමිසම මෙම පුලුල් වන අයවැය දැදුරුවලට ඇබ ගසන්නට යන්නේ කම්කරු පන්තියේ වියදමිනි.

ග්‍රීසිය මූල්‍ය කොල්ලකරුවන්ට විශේෂ වාසිදායක අවස්ථාවක් සපයයි. එක ම ව්‍යවහාර මුදලක් භාවිත කල ද ජර්මනිය නය සඳහා ගෙවනවාට වඩා සියයට 3.5කින් වැඩි පොලියක් එය සිය නය සඳහා ගෙවිය යුතු ය. ඉතා ම සුලු පොලී අනුපාතිකයක්

යටතේ යුරෝපා මහ බැංකුවෙන් මුදල් නයට ගත හැකි බැංකුවලට — රාජ්‍යය බංකොලොත් වීමේ අවදානමකට රට මුහුන පා ඇත යන කරුන පදනම් කර ගෙන — අසාධාරන පොළී අනුපාතිකයක් යටතේ ඒවා ග්‍රීසියට නයට දී අතිවිශාල ලාභයක් උපයා ගත හැකි ය.

මේ අතරවාරයේ, රට බලාත්කාරයෙන් ජාත්‍යන්තර සමපේක්ෂන සුළිය තුලට තල්ලු කෙරෙමින් පවතින අතර, ප්‍රතිඵලය වනු ඇත්තේ අයවැය අර්බුදය තීව්‍ර වීම යි. *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතට අනුව, යුරෝව ඔට්ටුවට තබමින් ආරක්ෂන අරමුදල් ආයතන සහ සමපේක්ෂකයන් පසු ගිය සඳුදා ඩොලර් බිලියක 8කට ආසන්න මුදලක් ආයෝජනය කල අතර, එය වූකලි ව්‍යවහාර මුදලක පිරිහීම අපේක්ෂා කරමින් මෙතෙක් ආයෝජනය කල විශාලතම මුදල වේ. බොහෝ මාධ්‍ය ආයතන, බ්‍රිතාන්‍ය පවුම ඔට්ටුවට තබමින් 1992 දී ජෝර්ජ් සොරස් සිදු කල සමපේක්ෂනය — එහි දී සොරස්ට බිලියන ගනනක ලාභයක් ගෙන දෙමින් බ්‍රිතාන්‍ය මහ බැංකුව පවුම අවප්‍රමානය කලේ ය — සමග මෙය සංසන්දනය කර ඇත.

යුරෝපා කොමිසම මූල්‍යයේ ඇපකාර පියවරුන්ගේ උපදේශකයකු ලෙස සේවය කිරීමත් සමග, ග්‍රීසියෙහි අර්බුදය — මාෆියාවේ විධික්‍රමවලට සමාන විධික්‍රම යොදා ගන්නා — මූල්‍ය ප්‍රාග්ධනයේ වඩාත් ම පරපෝෂිත නියෝජිතයන් ආකර්ෂනය කර ගනිමින් සිටී.

ප්‍රජාතන්ත්‍රවාදී උපාය මාර්ග හරහා එවැනි අරමුනු මුදුන් පමුනුවා ගත නොහැකි ය. ජෝර්ජ් පැපැන්ඩ්‍රියෝ නායකත්වය දෙන ග්‍රීසියේ පැසොක් (PASOK) ආන්ඩුව යුරෝපා සංගමය සමග සහයෝගී වීමට කැමැත්තෙන් රැඩිකල් ආර්ථික කප්පාදු ක්‍රියාත්මක කිරීමට පවතින සිය සූදානම පල කරන අතරවාරයේ, එම ප්‍රතිපත්තිය කෙරෙහි ප්‍රජාතන්ත්‍රවාදී උපාය මාර්ග ඔස්සේ බලපෑමට ග්‍රීක ජනයාට පවතින සියලු ම අවස්ථා යුරෝපා සංගමය පැහැර ගෙන ඇත.

සත් වසරක ලේ වැකි පාලනයකට පසුව ග්‍රීක මිලිටරි ආඥාදායකත්වය පෙරලා දමනු ලැබ ගත වී ඇත්තේ 36 වසරක් පමනකි. සමාන තත්ත්වයක් කරා ආපසු යාමට පවතින ඉඩකඩ බැහැර කල නොහැකි ය. යුරෝපා සංගමයේ බලාත්කාරී පිළිවෙත යොමු වන්නේ එම දිසාවට ය.

යුරෝපා සංගමය සහ ඒ පසුපස සිටින මූල්‍ය කතිපයාධිපත්‍යය වර්තමානයේ දී බලාපොරොත්තු තබා සිටින්නේ, දක්ෂිනාංශික කරමන්ලිස් ආන්ඩුවට එරෙහිව පැන නැගි මහජන විරුද්ධත්වය මතින් මැතිවරනය ජය ගත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පැසොක් ආන්ඩුව කෙරෙහි ය. පැසොක් ආන්ඩුව බලාපොරොත්තු තබා සිටින්නේ, මහජන විරුද්ධත්වය වාෂ්ප කර හැරීම ම ඉලක්ක කර ගෙන ඒකාබද්ධ නොවූ සහ සීමිත වූ ක්‍රියාවන් සංවිධානය කර එය පාලනයට නතු කර තබා ගැනීමට උත්සාහ කරන වෘත්තීය සමිති කෙරෙහි ය.

වෘත්තීය සමිති බලාපොරොත්තු තබා සිටින්නේ, අවස්ථාවාදී, ව්‍යාජ වාම පක්ෂ කෙරෙහි ය — එනම්, තමන්ට දේශපාලන ආරක්ෂාව සපයන, මහජන කෝපය ජාතිකවාදී මංපෙත් ඔස්සේ යොමු කිරීමට තමන් දරන ප්‍රයත්නයන්ට රුකුල් දෙන සහ කම්කරු පන්තිය උදෙසා සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනයක් වර්ධනය වී ඒම අවහිර කරන ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය සහ සිරිසා (SYRIZA) සන්ධානය කෙරෙහි ය.

කෙසේ වුව ද, මෙම සංවිධාන වඩ වඩාත් අපකීර්තියට පත් වෙමින් පවතින අතර, වැඩ කරන ජනයා මත එම සංවිධාන පවත්වා ගෙන පාලනය අහිමි වී යාමට බොහෝ ඉඩකඩ ඇත. මුහුනට මුහුන ලා සිදු වන විවෘත සට්ටනයක් සඳහා පවතින ඉඩකඩ වර්ධනය වෙමින් පවතින තතු යටතේ, කම්කරුවන් අවශ්‍ය දේශපාලනික නිගමන උකහා ගනිමින් එවැනි අනපේක්ෂිත සංසිද්ධියකට මුහුන දීමට සූදානම්ව සිටිය යුතු ය.

ග්‍රීක පිළිවෙතට අදාල සියලු තීන්දු හැඩ ගැස්වෙන්නේ බ්‍රසල්ස්හි ය යන කරුනෙන් පමනක් වුව ද පෙන්නුම් කෙරෙන්නේ අර්බුදයට ජාතික විසඳුමක් නැත යන්න යි. ජාතික විසඳුමක් පිළිබඳව දොඩමින් කම්කරුවන් මුලා කිරීමට උත්සාහ කරන බලවේග — ඔවුන් දේශපාලන ප්‍රවාහය තුල සිටින වම්මුන් වේවා දකුනන් වේවා — කම්කරුවන් යොමු කරන්නේ ආවෘත අන්තයකට ය. නිෂ්පාදනය සහ මූල්‍ය වෙලඳ පොලවල භූගෝලීයකරනය, සියලු ජාතික ක්‍රියා මාර්ගවල පදනම දිගු කලකට ඉහත දී ම උගුලුවා දමා ඇත.

ප්‍රධාන මූල්‍ය ආයතන සහ සංගත අත්පත් කර ගෙන ඒවා ප්‍රජාතන්ත්‍රවාදී සාමාජීය පාලනයට නතු කරන සමාජවාදී ක්‍රියා මාර්ගයක් සඳහා, යුරෝපා සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය දෙසට හැරී ගනිමින් ග්‍රීක කම්කරුවන් සටන් වැදිය යුතු ය.

ජර්මනියෙහි, ප්‍රන්සයෙහි, ඉතාලියෙහි, ස්පාඤ්ඤයෙහි සහ අන් යුරෝපා සංගම් රටවල වෙසෙන කම්කරුවන් ග්‍රීක කම්කරුවන්ගේ මග ගත යුතු ය. ග්‍රීසියෙහි ක්‍රියාත්මක කරන්නට යන දැඩි කප්පාදු කිරීම් මුදුන් පමුනුවා ගන්නට යුරෝපා කොමිසම සමත් වුව හොත් ඊලඟ ගොදුර බවට පත් වනු ඇත්තේ ඔවුන් ය.

පස් වසරකට කලින්, ප්‍රන්ස සහ ඕලන්ද ඡන්දදායකයෝ යුරෝපා ව්‍යවස්ථාවක් ඇති කිරීම සඳහා ඉදිරිපත් කල කෙටුම්පත් යෝජනාව ප්‍රතික්ෂේප කලහ. *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* කර්තෘ මන්ඩලය ව්‍යවස්ථාවට විරුද්ධත්වය පෑවේ මෙසේ ලියමිනි: " 'එසේ යැ'යි ඡන්දය දෙන කවුරුන් හෝ ඡන්දය දෙන්නේ 'යුරෝපය සඳහා' නො වේ යැයි ව්‍යවස්ථාවට

පක්ෂව කතා කරන්නෝ කියති. එවැනි ඡන්දයක් ධනේශ්වර රාජ්‍යය ද ධනපති පෞද්ගලික දේපොල ද මිලිටරිවාදය සහ අධිරජ්‍යවාදී විදේශ ප්‍රතිපත්තිය ද සුජාත භාවයට පත් කරයි. එය ප්‍රධාන සංගතවල සහ බැංකුවල ලාභ අවශ්‍යතාවලට ජනතාවගේ මූලික අවශ්‍යතා යටත් කරන යුරෝපයක් සුජාත භාවයට පත් කරයි.”

එතැන් පටන් ගත වුනු කාලය තුල දී, ලිස්බන් ගිවිසුමේ රූපාකාරයෙන් පැල දොරින් ක්‍රියාවට නැංවුනු විධික්‍රම ඔස්සේ යුරෝපා ව්‍යවස්ථාව පනවනු ලැබ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කල අනතුරු ඇඟවීම මුලුමනින් ම සනාථ වී ඇත. එවක අප තව දුරටත් ලියූ දෙය අදට ද මුලුමනින් ම අදාල යඃ "කම්කරු පන්තියේ අවශ්‍යතා අව්‍යාජ ලෙස මූර්තිමත් කරමින් යුරෝපා සංගමයට සහ එහි ව්‍යවස්ථාවට එරෙහිව පිහිටා ගත් එක ම විකල්පය වන්නේ යුරෝපා එක්සත් සමාජවාදී ජනපදය යි.”

**පීටර් ෂ්වාර්ස්**

© www.wsws.org